# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 29 දරන ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි — තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1979 අංක 29 දරන ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 57/78

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 29 දරන ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1969 අංක 17 දරන පනතේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (6) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය." ; තවද

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත්, කිරීමෙන් :—

" (7) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙන් පසු හැකි ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය.".

✱ 40755 — 11,750 (79/05)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.